**හිතවත් ගනුදෙනුකරුවනි,**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ගනුදෙනුකරු ප්‍රඥප්තිය යටතේ සදහන් කර ඇති අවශ්‍යතාවයකට අනුව, අප විසින් පිරිනමනු ලබන්නාවූ, ඔබට අවශ්‍යවන සහ ඔබට සුදුසු බැංකු නිපැයුම්/සේවාවන් තෝරා ගැනීමේදී ඔබට සහය වීම අරමුණු කොටගෙන ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මා ලා වක් අප විසින් සකස් කර ඇත.
මෙම ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මඟින් ඔබට විවිධාකාරයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සහ ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ පිළිබදව සහ පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පුද්ගලික විදේශ මුදල් ගිණුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ඔබට ලබා දෙනු ඇත.

කෙසේ වෙතත්, පහත සදහන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛන (KFD) හි දක්වා ඇති කරුණු, නීතියෙහි සහ නියාමනයෙහි සිදුවන වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව සංශෝධනයට ලක්විය හැකි බව කරුණාවෙන් සලකන්න. බැංකුවේ එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛන (KFD) හි කෙරෙන ඕනෑම සංශෝධනයක් පිළිබදව බැංකුව විසින් ඔබ දැනුවත් කරනු ලබන බව සලකන්න.
ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සදහන් www.nationstrust.com ඔස්සේ හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන අංක 011 4 711 411 හරහා අප හා සම්බන්ධ වන්න.

පහත සපයා ඇති ඔබගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ඔබට කුමන හෝ පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර පැමිණිලි නිරාකරණය කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 2 යන ලිපිනයට පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් අප වෙත යොමු කරන්න. නැතහොත් දුරකථන: [+94(0)114711411] / [customerservice@nationstrust.com] යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ වන්න. අපි ඉක්මනින් ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

## නේෂන්ස් සැලරි සේවර් ගිණුමේ ප්‍රධාන කරුණු

| ගිණුම පිළිබද විස්තර | ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ | ගනුදෙනුකරුවන්ගෙන් අයකරනු ලබන ගාස්තු/අයකිරීම්/කොමිස්/පොලී | පහසුකම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| • නේෂන්ස් සැලරි සේවර් ගිණුම<br><br>- නේෂන්ස් සැලරි සේවර් ගිණුමක් යටතේ ගනුදෙනුකරුවන්ට තම වැටුප නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට ප්‍රේෂණය කර නොයෙකුත් ප්‍රතිලාභ භුක්ති විඳිය හැකිය.<br><br>• මෙමගින් ඉතිරිකිරීමේ ගිණුමක් සහ එය හා සම්බන්ධ කර ඇති ජංගම ගිණුමක් ද විවෘත කිරීමට හැකියාවක් පවතී. | • ඩෙබිට් කාඩ්පතක් - නේෂන්ස් ෂොපින් ඩෙබිට් කාඩ්පත<br><br>• ස්ථාවර උපදෙස් සැකසීම් 1 ක් නොමිලේ.<br><br>• ඩිජිටල් බැංකු පහසුකම් - සම්බන්ධ වීමේ ගාස්තුවක් හෝ වාර්ෂික ගාස්තුවක් නොමැතිව අන්තර්ජාල සහ ජංගම බැංකු පහසුකම්. | • තඩත්තු ගාස්තුවක් අය නොකෙරේ.<br><br>• අවම වැටුප් අවශ්‍යතාවයට අනුව මාසික වැටුප ප්‍රේෂණය නො කරන ගනුදෙනුකරුවන්ගෙන් මාසිකව වැටුප් ප්‍රේෂණය නොකිරීම වෙනුවෙන් ගාස්තුවක් අය කෙරේ.<br><br>***NSS වැටුප්:*** *රු. 10,000/- ට අඩු වැටුප් ප්‍රේෂණය සඳහා මසකට රු.250/- ක් අය කෙරේ.* | • සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි සහ (නියමිත පරිදි අත්සන් කරන ලද) MIS පෝරමය සමග සම්මත ගිණුම් විවෘත කිරීමේ විධානය (මැන්ඩේට්) සම්පූර්ණ කර පහත සඳහන් ලේඛන සමග ඕනෑම බැංකු ශාඛාවකට ඉදිරිපත් කළ යුතුය: '<br><br>• තහවුරු කරන ලද බලයලත් වැටුප් පත්‍රිකාවක් ලබා නොදෙන්නේ නම්, දළ වැටුපේ විස්තර පැහැදිලිව සඳහන්වන වැටුප තහවුරු කිරීමේ ලිපියක් සැපයිය යුතුය.<br><br>• සේවා යෝජකයා විසින් මෙම ලේඛනයට සමාගම් නිල මුද්‍රාව තබා අත්සන් කර තිබිය යුතුය.<br><br>• ජා තික හැඳුනුම්පත් පිටපත (විදෙස් ගමන් බලපත්‍රය පිළිගත නොහැකි අතර ගිණුමක් විවෘත කළ හැක්කේ වලංගු ජාතික හැඳුනුම්පතක් ඇතොත් | **සුදුසුකම් ලැබීමේ නිර්ණායක**<br><br>• වලංගු ජාතික හැඳුනුම්පතක් (NIC) හිමි වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්.<br>• අයදුම්කරු රැකියාවක නිරතව සිටිය යුතු අතර ඔහුගේ / ඇයගේ නිත්‍ය දළ වැටුප රුපියල් 20,000 ක් හෝ ඊට වැඩි විය යුතුය.<br>• අයදුම්කරු සේවක අර්ථසාධක අරමුදලෙහි දායකයෙකු සහ/හෝ, සුදුසුකම් ලත් වෘත්තිකයෙකු (උදා: CIMA, ACCA, CIM, IESL, වාස්තු විද්‍යාඥ, ICA, CFA, වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙක් හෝ ඒ සමාන වෙනත් සුදුසුකමක්) සහ/හෝ විශ්‍රාම වැටුපට සහ/හෝ සේවක අර්ථසාධක අරමුදලට දායකවන පුද්ගලයකු විය යුතුය.<br><br>**අනෙකුත් තොරතුරු, නියමයන් සහ කොන්දේසි**<br><br>• අවම මූලික තැන්පතුව LKR 2,000/- විය යුතුය (කෙසේ වෙතත් ඉදිරි දින 30 ඇතුළත වැටුප ගිණුමට බැර කළ යුතුය)<br><br>• පහත සඳහන් ආකාරයට වැටුප නේෂන්ස් සැලරි සේවර් ගිණුමට බැර කළ හැකිය;- සේවා යෝජකයා විසින් SLIP පතක් යැවීම/ගිණුමට බැරකිරීම හරහා හෝ 'කළමනාකරු, නේෂන්ස් ට්‍රස් බැංකුව, |

| | | | | |
|---|---|---|---|---|
| | | | පමණි)<br><br>• මැන්ඩේට් හි සදහන් කර ඇති ස්ථිර ලිපිනය තහවුරු කිරීමට උපයෝගිතා බිල්පත/බැංකු ගිණුම් ප්‍රකාශය/බදු තක්සේරුව/පළාත් පාලන අධිකාරියක් විසින් ලබා දී ඇති ලිපියක් (පසුගිය මාස 3 ඇතුළත නිකුත් කළ එකක් විය යුතුය)<br><br>• අයදුම්කරු සේවක අර්ථසාධක අරමුදලෙහි / සේවක භාරකාර අරමුදලෙහි දායකයෙකු නොවන්නේ නම්, ඔහු/ඇය පූර්ණ කාලීනව රැකියාවක නියුතු සුදුසුකම් ලත් වෘත්තිකයෙකු විය යුතුය (උදා: CIMA, ACCA, CIM, IESL, වාස්තු විද්‍යාඥ, ICA, CFA, වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙක් හෝ ඒ සමාන වෙනත් සුදුසුකමක්). | (ගිණුම් හිමියාගේ නම) වෙනුවෙන්' ලියන ලද චෙක්පතක් තැන්පත් කිරීම හරහා හෝ ඉදිරි දින 30 තුළ වෙනත් බැංකු ගිණුමකින් ලබාගත් ස්ථාවර නියෝගයක් හරහා.<br><br>• නොමිලේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවලින් අසීමිතව මුදල් ආපසු ගැනීමේ ප්‍රතිලාභය හැර ජංගම ගිණුම් වලට, පවතින පුද්ගලික ජංගම ගිණුමට සමාන විශේෂාංග ඇත.<br><br>ජංගම ගිණුමක් විවෘත කිරීම තෝරාගත හැකි විකල්පයකි. අයිරා පහසුකම ලබා ගැනීම සඳහා නේෂන්ස් සැලරි සේවර් ජංගම ගිණුමක් විවෘත කිරීම අනිවාර්ය වේ. සාමාන්‍ය පුද්ගලික ජංගම ගිණුම් විවෘත කිරීමේ ක්‍රියා පටිපාටිය අදාළ වේ.<br><br>• නේෂන්ස් සැලරි සේවර් ජංගම ගිණුමක් පමණක් විවෘත කිරීමේ විකල්පය ගනුදෙනුකරුවන්ට නොමැත.<br><br>• මාස 3ක් අඛණ්ඩව නේෂන්ස් සැලරි සේවර් ගිණුමට වැටුප බැර නොවන්නේ නම් නේෂන්ස් සැලරි සේවර් ගිණුමේ ප්‍රතිලාභ බැහැර කරනු ලැබේ. |

- මෙහි අඩංගු නිශ්චිත නියමයන් සහ කොන්දේසි වලට අමතරව, සියලුම සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි නේෂන්ස් සැලරි සේවර් ගිණුමට අදාළ වන අතර පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටීන් පොදු ව්‍යාපාර කොන්දේසිය යටතේ https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf හි දක්වා ඇත.
- කලින් කලට සංශෝධනයට ලක් විය හැකි ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.
- මෙම බැංකුව, රු. 1,100,000/- ක් දක්වා තැන්පත් කරන එක් තැන්පත්කරුවකුට රැකවරණය සපයනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) යටතේ

ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා  තැන්පතු රක්ෂණ යෝජනා ක්‍ර මයේ (SLDIS) සාමාජිකයෙකු වේ.

- මෙම ලේඛනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට, මෙහි ඉංග්‍රීසි භාෂා  පාඨය බලපැවැත්විය යුතුය.